රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2024-06-11 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **යෝජිත ශ්‍රී ලංකා-මැලේසියා නිදහස් වෙළෙඳ ගිවිසුම**

ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය නැවත ලබා ගැනීම උදෙසා අපනයනය ඉලක්ක කර ගත් සෘජු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ, අපනයන විවිධාංගීකරණය කිරීමේ සහ භාණ්ඩ හා සේවා සඳහා වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කිරීමේ වැදගත්කම හඳුනාගෙන තිබේ. ඒ සඳහා ශ්‍රී ලංකාව විසින් ශක්තිමත් සහ උපායමාර්ගික ආර්ථිකයන්ගෙන් යුතු රටවල් සමඟ ආර්ථික ඒකාබද්ධතාව වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ආසියාන් (ASEAN) සංවිධානයේ හා කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වයෙහි ප්‍රධාන සාමාජිකයෙකු වන මැලේසියාව, ශ්‍රී ලංකාවේ 34 වන අපනයන ගමනාන්තය වන අතර, 2023 වර්ෂයේදී එරටට සිදු කරනු ලැබ ඇති සමස්ත අපනයනයන්හි වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 58.3කි. ඒ අනුව, ශ්‍රී ලංකාව සහ මැලේසියාව අතර නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළඹීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් ඒ සඳහා වන සාකච්ඡා ආරම්භ කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර සඳහා නැවත සකස් කර ප්‍රතිඅපනයනය කිරීම පිණිස තෝරාගත් කුළුබඩු ආනයනය කිරීමට අවස්ථාව ලබා දීම සඳහා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ආනයන පාලන රෙගුලාසි නිකුත් කිරීම**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කළ 2024 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි නැවත සමාලෝචනය කර සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2024-03-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත. ඒ අනුව, ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවේ ඇතුළත් පහත නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* තෝරාගත් කුළුබඩු ආනයනය, සැකසුම් කිරීම සහ තෙල් නිස්සාරණය, ඔලියොරෙසින් හා අවශේෂ ස්වරූපයෙන් ප්‍රතිඅපනයනය කිරීමේ ක්‍රියාපටිපාටිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර සඳහා නැවත සකස් කර ප්‍රතිඅපනයනය කිරීම සඳහා තෝරාගත් කුළුබඩු ආනයනය කිරීමට අවස්ථාව ලබා දීම.

* ඉහත කාර්යය සඳහා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි නිකුත් කිරීම.

03. **ශ්‍රී ලංකාවේ ජාතික තීරු බදු ප්‍රතිපත්තිය**

රටක් තුළ වෙළෙඳ හා ආයෝජන සඳහා තරගකාරී පරිසරයක් පවත්වා ගැනීම කෙරෙහි පැහැදිලි, සරල, සංගත සහ පුරෝකථනය කළ හැකි තීරු බදු ක්‍රමයක් පැවතීම තීරණාත්මක සාධකයක් වේ. පැවති රජයන් විසින් වරින්වර හඳුන්වා දෙනු ලැබ ඇති විවිධ ප්‍රතිපත්තීන් අනුව තීරු බදු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම හේතුවෙන් මෙරට ආයෝජන සඳහා වන තරගකාරී පරිසරයට අයහපත් බලපෑමක් සිදු ව ඇත. එම තත්ත්වය සැලකිල්ලට ගනිමින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ උපදෙස් මත ජාතික තීරු බදු ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ නියෝජිතායතනවල සාමාජිකයන්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් පත් කර තිබේ. එම කමිටුව විසින් වෙළෙඳ කටයුතු පිළිබඳ විශේෂඥයන්ගේ සහ මෙම විෂයය හා සම්බන්ධිත අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ මග පෙන්වීම යටතේ ව්‍යාපාරික සහ කර්මාන්ත ප්‍රජාව සමඟ සාකච්ඡා කර ජාතික තීරු බදු ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබ ඇත. 2025 ජනවාරි මස සිට අදියර තුනක් (03) යටතේ එම ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාත්, පාර්ශ්වකරුවන්ගේ දැනුවත්භාවය සහ අනුකූලතාව සහතික කිරීමේ අරමුණින් රේගු ආඥාපනතේ 101 වන වගන්තිය යටතේ එම ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කිරීම සඳහාත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. "දිස්ත්‍රික් කර්මාන්ත සභා" පිහිටුවීම

ප්‍රාදේශීයව ස්ථාපිත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට වර්තමානයේ ගැටලු රාශියකට මුහුණ පෑමට සිදු ව ඇති අතර, එකී අභියෝගවලට මුහුණ දීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වඩාත් සුදුසු, පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ සැමට ප්‍රතිලාභ සලසන්නා වූ ක්‍රමවේදයක අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ සඳහා, බහුආංශික සහ ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ප්‍රාදේශීය මට්ටමින් ගුණාත්මක හා කාර්යක්ෂම ආයතනික සහායයන් හා සේවාවන් ලබා දීමට හැකි වන පරිදි අදාළ සියලුම ආයතන අතර ශක්තිමත් සබඳතා ස්ථාපිත කිරීම, ජාලගත කිරීම හා ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වී ඇත. ඒ අනුව, මුළු දිවයිනම ආවරණය වන පරිදි "දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන සභා" 25ක් ස්ථාපිත කිරීමටත්, එකී සභාවල ව්‍යුහය, කාර්යභාරය හා වගකීම් තීරණය කිරීමට සහ සමස්ත ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා අනෙකුත් අදාළ ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කිරීමටත් කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. ගම්පොල පැරණි අධිකරණ සංකීර්ණ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම

ගම්පොල අධිකරණ සංකීර්ණය පැවති ඉඩමේ පිහිටි පැරණි උසාවි ගොඩනැගිල්ල කඩා ඉවත් නොකර නවීකරණය කිරීමටත්, එම භූමිය රථගාලක් වශයෙන් සංවර්ධනය කිරීමටත් උඩපළාත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. එකී ඉඩමේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ ද අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන වටිනාකම නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඒකාබද්ධ අරමුදලට ගෙවීමේ පදනම මත ගම්පොල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොදු රථගාලක් හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස ගම්පොල පැරණි අධිකරණ සංකීර්ණය පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

06. **උස්බෙකිස්ථානු ජනරජය ලෝක වෙළෙඳ සංවිධානයට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් වන සන්ධාන ගිවිසුමට අත්සන් තැබීම**

ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජිකයෙකු වීම සඳහා උස්බෙකිස්ථානු ජනරජය අනෙකුත් සාමාජික රටවල් සමඟ වසර ගණනාවක සිට සාකච්ඡාවල නිරත වෙමින් සිටී. ලෝක වෙළෙඳ සංවිධානයේ මහා මණ්ඩලය විසින් උස්බෙකිස්ථානයේ අයදුම්පත්‍රය පරීක්ෂා කර, ප්‍රවේශ වීමේ සන්ධාන කෙටුම්පතක් සමඟ අදාළ නිර්දේශ මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කරනු ලැබ ඇත. උස්බෙකිස්ථානයට තේ අපනයනය කිරීමේ අභිලාෂය ඇතිව අදාළ ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව ද පත් ව ඇති අතර, ශ්‍රී ලංකාවේ අදාළ නිලධාරින් උස්බෙකිස්ථානු නිලධාරින් සමඟ ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කර එරටට අපනයනය කිරීමට බලාපොරොත්තු වන තේ නිෂ්පාදන සඳහා වඩා අඩු වෙළෙඳ බදු බැඳීම් සම්බන්ධයෙන් මූලික එකඟතාවන්ට එළඹ ඇත. ඒ අනුව, ලෝක වෙළෙඳ සංවිධානයේ අදාළ විධිවිධාන පරිදි ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූ බව තහවුරු කරමින් උස්බෙකිස්ථානය විසින් "ප්‍රවේශ වීම පිළිබඳ සන්ධාන ගිවිසුම" ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙකු වන ශ්‍රී ලංකාව සමඟ අත්සන් තැබිය යුතුව තිබේ. එකී ගිවිසුමට අත්සන් තැබීම පිණිස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ශ්‍රී ලංකා ආහාර විද්‍යා සහ තාක්ෂණ ආයතනය පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත**

ශ්‍රී ලංකා ආහාර විද්‍යා සහ තාක්ෂණ ආයතනය පිහිටුවීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ පනත් කෙටුම්පත සකස් කර ඇති අතර, එම පනත් කෙටුම්පත සඳහා නීතිපති විසින් සංශෝධන ගණනාවක් යෝජනා කර තිබේ. එකී සංශෝධන ද ඇතුළත් කරමින් ශ්‍රී ලංකා ආහාර විද්‍යා සහ තාක්ෂණ ආයතනය පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය කඩිනමින් අවසන් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. ලිංගික හිරිහැර සහ ලිංගික අඩන්තේට්ටම් තහනම් කිරීම සඳහා නෛතික විධිවිධාන ශක්තිමත් කිරීම පිණිස දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම**

පොදු ස්ථානවලදී සිදු වන ලිංගික හිරිහැර සහ ලිංගික අඩන්තේට්ටම් ඇතුළු සියලු ආකාරයේ ලිංගික හිරිහැර සහ ලිංගික අඩන්තේට්ටම් අපරාධයක් බවට පත් කරමින් දණ්ඩ නීති සංග්‍රහය සඳහා සංශෝධන හඳුන්වා දීම පිණිස 2022-12-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. නව ආගමන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත අවස්ථා ගණනාවකදී සංශෝධනය කර ඇති නමුත්, එකී පනතින් ආවරණය වන ක්ෂේත්‍රය තුළ සීඝ්‍රයෙන් සිදු වන වෙනස්කම්, තාක්ෂණයේ වේගවත් දියුණුව මෙන්ම ජාත්‍යන්තර ප්‍රවණතාවන් ද සැලකිල්ලට ගෙන, ඒ සඳහා නව පනතක් හඳුන්වා දීම පිණිස 2021-02-15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම**

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2023-05-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපති විසින් නිරීක්ෂණ ඉදිරිපත් කර තිබේ. එකී නිරීක්ෂණ මත පදනම්ව අදාළ පනත් කෙටුම්පත සකස් කිරීමේ

කාර්යය කඩිනමින් නිම කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කළ 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සහ එම පනත යටතේ නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකාවට මෝටර් වාහන ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති නමුත්, සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් පරිදි සංචාරකයින් ප්‍රවාහනය කිරීම සඳහා කුඩා ප්‍රමාණයේ බස්රථ 250ක් සහ වෑන් රථ 750ක් ආනයනය කිරීම පිණිස 2024-04-01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, එකී තීරණය ක්‍රියාත්මක කිරීම පිණිස 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ 2024 අංක 07 දරන ආනයන හා අපනයන පාලන රෙගුලාසි ප්‍රකාශයට පත් කර ඇත.

එසේම, ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍යය සහ පරිසරය සුරක්ෂිත කිරීමේ අරමුණින් HS කේත 217ක් යටතේ වර්ගීකරණය කරන ලද කාණ්ඩ 122ක භාණ්ඩ ආනයනය කිරීමේදී ප්‍රමිති සහ තත්ත්ව ස්ථාපිත කිරීම පිණිස 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ පනවා තිබූ 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) රෙගුලාසි අවලංගු කරමින්, කඩිනම්, ආරක්ෂිත සහ ඵලදායී වෙළෙඳ ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීමට මෙන්ම දේශීය නිෂ්පාදන සහ ආනයනික නිෂ්පාදන සඳහා සාධාරණ අවස්ථා සහතික කිරීමට ද හැකි වන පරිදි රෙගුලාසි පැනවීමට 2024-03-11 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි ප්‍රකාශයට පත් කර තිබේ. අති විශේෂ ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති එකී රෙගුලාසි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **පෙට්‍රල් 92 Unl නැව් තොග 05ක් මිල දී ගැනීම වෙනුවෙන් වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

2024-07-15 සිට 2025-01-14 දින දක්වා මාස 06ක කාලයක් සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත පෙට්‍රල් 92 Unl බැරල් මිලියන 1.5 +/- 5% සපයා ගැනීම සඳහා එම සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් ලංසු කැඳවා ඇත. ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත පදනම්ව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් එකී ප්‍රසම්පාදනය M/s Aditya Birla Global Trading (Singapore) Pte. Ltd. වෙත පිරිනැමීම නිර්දේශ කර තිබේ. ඒ අනුව, එම සමාගම වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වැනි වගන්තිය යටතේ නව නියමයක් නිකුත් කිරීම**

රට තුළ විදේශ විනිමය සංචිත අඩුවෙමින් පැවති කාලය තුළදී නේවාසික තැනැත්තන් විසින් සිදු කරන ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා තාවකාලික අත්හිටුවීම් සහ සීමා පනවමින් රට තුළ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වැනි වගන්තිය යටතේ නියමයක් 2020-04-02 දින සිට බලාත්මක කර තිබේ. එකී නියමය මාස 06ක වලංගු කාලසීමාවක් සහිතව අඛණ්ඩව වරින්වර නිකුත් කර ඇති අතර, දැනට බලාත්මක නියමය 2024-06-19 දින දක්වා වලංගු වේ. විශේෂයෙන්ම නේවාසික සමාගම්වලට විදේශ රටවල සිය ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ඇතැම් අත්හිටුවීම්/සීමා කිරීම් තවදුරටත් ඉවත් කරමින්/ලිහිල් කරමින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22(1) වගන්තිය යටතේ 2024-06-20 දින සිට බලාත්මක වන පරිදි මාස 06ක කාලසීමාවක් සඳහා නව නියමයක් නිකුත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව, එකී නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22(1) වගන්තිය යටතේ නියමයක් නිකුත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව - 2023**

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතෙහි 13 වන වගන්තිය යටතේ අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව හා මහජනතාව වෙත මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස 05ක් ගත වීමට පෙර නිකුත් කළ යුතු වේ. ඒ අනුව, 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, ක්‍රමෝපායයන් හා අභියෝග, 2023 වර්ෂයේ ආර්ථික ප්‍රවණතා, රාජ්‍ය මූල්‍ය අංශය, මූර්ත අංශය, දේශීය ඉල්ලුම් හා සැපයුම, ආයෝජන හා ඉතුරුම්, විදේශ අංශයේ සහ මූල්‍ය අංශයේ සංවර්ධනයන්, උද්ධමනය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා ආවරණය කරමින් 2023 වර්ෂය සඳහා වන අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව 2024-05-31 දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************